

ලියා දන්වන වග යි

# හයවන වසරට

සන්නසේ අපි සුවපහසු නොවන දුෂ්කර මාවතක් ඔස්සේ අනාගතය කරා ගමනක් ආරම්භ කළෙමු. ඒ ගමනට දැන් වසර පහක් ගතවී තිබේ. පුවත්පතකට වසර පහක් යනු දීර්ඝ කාලයක් නොවුණද නවීන මාධ්‍ය තාක්ෂණ ක්‍රියාකාරීත්වය තුළ ලෝකය වෙළඳ පොලක් බවට පත්වෙමින් ඇති අවදියක එය දරා ගනිමින් එයට ගැලපෙමින් වසර පහක් පැවතීම යනු අපට සියවස් පහක් තරම් දීර්ඝ කාලයක් සේ වටිනා බව නොකිවමනා ය.

අපේ ඉදිරි මග වඩාත් අර්ථපූර්ණ කර ගැනීම පිණිස මේ මොහොතේ අතීත ගමන් මග දෙස මදක් හැරී බැලීම වටනේ ය.

යමෙකුට අනුන් ගැන ලිවීම හෝ විවේචනය කිරීම හෝ පහසු කටයුත්තක් වුවද තමන් ගැන ලිවීම එතරම් පහසුවන්නක් නොවේ.

ඉතා කුඩා කණ්ඩායමක් ලෙස සන්නස අරඹන විට අපට විශේෂ ඉලක්ක කීපයක් තිබුණි. පළමුවැන්න නම් මෙල්බන් සමාජය තුළ වෙනත් ආරක පුවත්පතකට ඇතිව තිබූ ඉඩකඩ සැපිරීමයි. දෙවැන්න වූයේ පුවත්පත් බලන්නට හුරු වී සිටි මිනිසුන් පුවත්පත් කියවන්නන් බවට පත් කිරීමයි. තෙවනුව මේ මෙල්බන් සමාජය තුළ වැඩි කොටසක් ගැලී සිටි සුඛෝපභෝගී කුටුම්බ ජීවිතයෙන් මුදා ගැනීම උදෙසා ඔවුන් තුළට යම් මතවාදයක් විවිධ ක්ෂෙත්‍ර ඔස්සේ කාන්දු කර සමාජය තුළ යම් උත්තේජනයක් ඇති කිරීමයි.

මේ සඳහා අපි විවිධ උපක්‍රම අත්හදා බැලුවෙමු. අප බොහෝ විට විශ්වාස කළේ තමුන්ගේ මතය තහවුරු කිරීමේ අරමුණින් කෙරෙන සංවාද වලට වඩා යමක් මුල් කරගෙන කෙරෙන විවෘත සංවාද ප්‍රතිඵලදායක බවයි. ඒ සඳහා අපි ඔබට බොහෝ දොරටු විවෘත කර ඇත්තෙමු.

මේ නිසා අප අපහසුතාවට පත් වූ අවස්ථා නැත්තේද නොවේ. අප දැඩි ලෙස විශ්වාස කරන්නේ ඕනෑම මාධ්‍යයකට එකඟ නොවිය යුත්තේ තර්කානුකූලව කරුනු ඉදිරිපත් කිරීමෙන් මිස එදිරිවාදිකමින් හෝ අභූත චෝදනා නැගීමෙන් නොවන බව ය. කෙසේ වුවත් අප ආ ගමන් මග ගැන අපි තෘප්තිමත් වින්නෙමු. ඉදිරි ගමන සඳහා මෙතෙක් ලැබූ අත්දැකීම් පන්නරයක් කර ගන්නෙමු. ගමනාරම්භයේ සිට මේ දක්වා එකටම සිටින සියලුම සොයුරන් සොයුරියන් වෙතත් නිරන්තරයෙන් අපට ධෛර්යය ලබා දෙන පාඨක ඔබටත් අපගේ අනුග්‍රාහක භවතුන්ටත් තුති පිදීමට මෙය අවස්ථාවක් කරගන්නෙමු. කෙතරම් දුෂ්කරතා පැමිනිය ද ආ මගට වැඩි දුරක් ඉදිැරියට ගමන් කරන්නට අප සූදානම් බවද මෙහිදී ශපත කරන්නෙමු.

ලබන්නා වූ අවුරුද්ද ඔබ සැමට යහපත් එකක් වේවායි පතන්නෙමු.

**සංස්කාරක**

සන්නස
www.sannasa.net




**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**උපදේශක සංස්කාරක / Advisory Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක /Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**SA**
Chandra Eeriyagama
08 8331 2318

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasanews@gmail.com
Tel/Fax : 03 3796 4241

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .